# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 935 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 03/06/2024 පැය 1215

## මාධ්‍ය නිවේදනය

### අධිකරණ නියෝගයක් දැනුම් දීම.

2024.06.03 වන දින සිට 2024.06.06 වන දින දක්වා විරෝධතාකරුවන් පිරිසක් විසින් වැලිකඩ පොලිස් වසමේ පොල්දූව වටරවුම ආශ්‍රිතව විරෝධතා ව්‍යාපාරයක් හා සත්‍යග්‍රහයක් පැවැත්වීමට සැලසුම් කර ඇති බවට වැලිකඩ පොලිස් ස්ථානාධිපතිවරයාට ලද තොරතුරක් මත එම විරෝධතාකරුවන්ට ප්‍රචණ්ඩකාරී හා කලහකාරී ක්‍රියාවන් වැළැක්වීමේ ආඥාවක් නිකුත් කරන ලෙසට ඔහු විසින් අපරාධ නඩු විධාන සංග්‍රහයේ පවතින ප්‍රතිපාදන ප්‍රකාරව කොළඹ ගරු ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයෙන් කරන ලද ඉල්ලීමට අනුව ගරු අධිකරණය මඟින් ඉදිරිපත් කර ඇති කරුණු සලකා බලා පහත සඳහන් වග උත්තරකරුවන් වන,

1. අල්ලස දූෂණ නාස්තියට එරෙහි පුරවැසි සංවිධානයේ ලේකම් සංජීව ධම්මික.
2. අල්ලස දූෂණ නාස්තියට එරෙහි පුරවැසි සංවිධානයේ සභාපති දුලාර ගුණතිලක.
3. විදුලි පාවිච්චි කරන්නන්ගේ සංගමයේ ලේකම් ජාමුණි කමන්ත තුෂාර

ඇතුළු සහභාගී වන වෙනත් තැනැත්තන්ට 2024.06.03 වන දින සිට 2024.06.06 වන දින දක්වා පොල්දූව වටරවුම ආශ්‍රිතව පැවැත්වීමට නියමිත විරෝධතා ව්‍යාපාරය හා සත්‍යග්‍රහයේදී සියළු වගඋත්තරකරුවන් හා ඔවුන්ගේ අනුගාමිකයන් විසින් මාර්ග භාවිතා කරන මහජනතාවට හා පදිකයින්ට අවහිර බාධා වන සේ කිසියම් මාර්ගයක් හරස් කර විරෝධතා හෝ ප්‍රචණ්ඩ ක්‍රියා නොකිරීමටත්, මහජන නියෝජිතයින්ගේ පාර්ලිමේන්තු වරප්‍රසාදයන් උල්ලංඝණය වන අයුරින් හා රාජකාරි යෙදී සිටින රාජ්‍ය නිලධාරීන්ගේ රාජකාරි සඳහා කිසිඳු බාධාවක් වන අයුරින් උද්ඝෝෂණ කිරීම තහනම් කරන අතර කිසිඳු පුද්ගලයෙකුට අවහිරයක් නොවන අන්දමින් මෙම උද්ඝෝෂණය සිදු කිරීමට සියළු වගඋත්තරකරුවන් හා අනුගාමිකයින් වග බලා ගත යුතුය. කිසිඳු අවස්ථාවක මාර්ගය අවහිර කරමින් පෙළපාලි පැවැත්වීම තහනම් කරමි. තවද, පොල්දූව වටරවුම ආශ්‍රිතව හෝ එම මාර්ගය හා මාර්ගය දෙපස කිසිඳු ඉදිකිරීමක් සිදු කිරීම තහනම් කරමින් එසේ වගකීම් ගැනීමට නොහැකි නම් අදාළ උද්ඝෝෂණය වගඋත්තරකරුවන් විසින් නොපමාව විසුරුවා හැරිය යුතු බවටත් අධිකරණය මඟින් ආඥාවක් නිකුත් කර ඇත.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**